**ආර් .ඒ.ධම්මිකා දමයන්ති කුමාරි එ. සෞඛ්‍යය , දේශීය , වෛද්‍ය , පරිවාස හා ළමා රක්ෂණ සේවා , සමාජ සුභසාධන සහ ග්‍රාමීය විදුලිබලය යෙදීමේ අමාත්‍යංශය, නැගෙනහිර පළාත, ත්‍රිකුණාමලය**

RTIC Appeal (පුද්ගලික වශයෙන් විභාග කිරීම)/ 883/2019 (02.04.2019 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ දී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය)**,** රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතිඥ  කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතිඥ  එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අභියාචක** - ආර් .ඒ.ධම්මිකා දමයන්ති කුමාරි
**නොතිසි ලත් පාර්ශවය** - ලේකම්, සෞඛ්‍යය අමාත්‍යංශය , නැගෙනහිර පළාත
**පෙනීසිටීම**
අභියාචක - පැමිණ නැත.
පොදු අධිකාරිය - පැමිණ නැත.

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2018.06.16 |
| තොරතුරු නිලධරයා තීරණය ලබා දුන් දිනය | 2018.07.30 |
| නම් කළ නිලධරයා වෙත අභියාචනය යොමු කළ දිනය | 2018.07.14 |
| නම් කළ නිලධරයා තීරණය ලබා දුන් දිනය | 2018.10.09 |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකළ දිනය | 2018.08.21 |

**අභියාචනයට පසුබිම් වූ කරුණු:**

අභියාචක විසින් 2018.06.16 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත තොරතුරු ඉල්ලා සිටින ලදී.

*අංක EP/04/EG/05/01 හා 2016.02.11 දිනැති ලිපිය අනුව නැගෙනහිර පළාත් සෞඛ්‍යය දෙපාර්තමේන්තු සෞඛ්‍යය අධ්‍යාපන නිලධාරී තනතුරට සීමිත පදනම මත බඳවා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණය 2016.2.17*

*දින පවත්වන ලදී. එම සම්මුඛ පරීක්ෂණයේදී එක් එක් නිලධාරියා විසින් ලබා ගත් ලකුණු සහ එම ලකුණු කුමන කරුණු සඳහා ලබා ගත්තේද යන්න පිළිබඳ විස්තර.*

තොරතුරු නිලධාරියා පනත ප්‍රකාරව, නියමිත කාලය තුළ පිළිතුරු සැපයීමට අපොහොසත් වූ බැවින් අභියාචක විසින් 2018.07.14 දිනැතිව නම්කළ නිලධරයා වෙත අභියාචනයක් යොමු කරන ලදී. නම්කළ නිලධාරියා ද පනත ප්‍රකාරව, නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වූ බැවින් අභියාචක විසින් 2018.08.21 දිනැතිව කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කරන ලදී.

2018.07.30 දිනැති ලිපිය මගින් 2015.02.17 වන දින නැගෙනහිර පළාත් සෞඛ්‍යය අමාත්‍යංශය මගින් පවත්වන ලද සෞඛ්‍යය අධ්‍යාපන නිලධාරී තනතුරට තෝරා ගැනීමේ සම්මුඛ පරීක්ෂණයේදී අභියාචක විසින් ලබා ගන්නා ලද ලකුණු ප්‍රමාණය 41 කි. ඒ අනුව අභියාචක 5 වන ස්ථානය ලබා ඇති බවත් ප්‍රථම ස්ථානය ලබා ගත් අයගේ ලකුණු ප්‍රමාණය 58 ක් වන අතර අදාල කාල සීමාව තුලදී සෞඛ්‍යය අධ්‍යාපන නිලධාරී තනතුරෙහි එක් පුරප්පාඩුවක් පමණක් පවතී අතර ඒ සඳහා ප්‍රථම ස්ථානයෙහි සිටි අයට පමණක් පත්වීම් ලබා දෙන ලද බව දන්වන ලදී.

ලේකම්, සෞඛ්‍යය අමත්‍යංශය , නැගෙනහිර පළාත 2018.10.09 දිනැති ලිපිය මගින් 2018.07.30 දිනැති ලිපිය මගින් අභියාචක වෙත තොරතුරු දන්වා ඇති බව දන්වන ලදී

**අභියාචනය සලකා බලන අවස්ථාවේ දී උද්ගත වූ කාරණා:**

අභියාචක සහ පොදු අධිකාරිය පැමිණ නැත.

ඒ අනුව අභියාචක සහ පොදු අධිකාරිය නොපැමිණීම නිසා 2019.07.23 දින ප.ව. 12.00 ට කල් තබන ලදී.

අභියාචනය මෙයින් කල් තැබේ.

*****